# චූටි කුකූ



විහිති රණවීර

# චූටි කුකූ

**කතෘ**

විහිනි දුලාරා රණවීර

**චිත්‍ර**

විහිනි දුලාරා රණවීර

**කෘතියේ අයිතිය**

විහිනි දුලාරා රණවීර

**කතෘගේ වෙනත් කෘති**

නපුරු වලහා

**මුද්‍රිත දිනය**

2023 ඔක්තෝබර්

**ISBN 978-624-206-704-9**

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙහි ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්"ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවනට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023.11.01

# පිදුම

**මගේ ආදර අත්තම්මාට සෙනෙහසින්.**

එකෝමත් එක දවසක මලී එයාගේ

අක්කා එක්ක ඉස්කෝලෙ ඇරිලා

එද්දි ගහක් යට පුංචි පෙට්ටියක්

තිබුණා."අක්කේ අපි මේ පෙට්ටිය

ඇරලා බලමු නේද?" මලී

අක්කාගෙන් ඇසුවා.



“ඔව් අපි ඇරලා බලමු” අක්කා කිව්වා.

ඒ දෙන්නා පෙට්ටිය අරිද්දිම චූටි බලු

පැටියෙක් පෙට්ටියෙන් එළියට

පැන්නා.

“අනේ නංගී අපි මෙයාව ගෙදර

එක්කන් යමු” අක්කා කිව්වා.

ඊටපස්සේ මේ දෙන්නා බලු පැටියත්

අරගෙන ගෙදර ගියා.

ඒ දෙන්නා දුවගෙන ගෙදර ගිහින් බලු

පැටියව අම්මට පෙන්නලා එයාව


හම්බවුණු හැටි කිව්වා.

“අනේ පව් අසරණ බලු පැටියා. මම

මෙයාව නාවනකන් ඔය දෙන්නා

ගිහින් ඇගපත හෝදගෙන

එන්නකො” අම්මා කිව්වා.



මලීයි එයාගේ අක්කයි ඇඟ

හෝදගෙන එද්දි සාලේ පුලුන්

බෝලයක් වගේ බලු පැටියා ඉන්නවා.


“අපි මෙයාට චූටි කුකූ කියලා නම

දාමු” මලී සතුටින් කිව්වා.

ඊටපස්සෙ එයාලා චූටි කුකූට රතු පාට

කරපටියක් දැම්මා.

ගෙදර හැමෝම එකතු වෙලා කුකූ කිරි බොන දිහා ආසාවෙන් බලාගෙන හිටියා. ටිකෙන් ටික හවස් වෙද්දි තාත්තත් ගෙදර ආවා. "මේ කව්ද මේ අළුත් සාමාජිකයා? මොනා නැතත් හරි හුරතල්" තාත්තා කිව්වා.



ඊටපස්සෙ අක්කයි නංගියි එකතු

වෙලා කුකූව ගෙදර එක්කරගෙන ආපු

විදිය තාත්තට කිව්වා. "ඒක හොඳයි

අසරණ බලු පැටියෙක්ට ඔයාලා පිහිට

උනා ඒකෙන් එයාට ඉන්න තැනකුයි

අපේ ගෙදරට ආරක්ෂාවයි දෙකම

ලැබෙනවා" තාත්තා මලීගෙයි

අක්කාගෙයි ඔළුවා අතගාමින් කිව්වා.



මලීයි අක්කයි සුපුරුදු විදියට

ඉස්කෝලෙ යන්න ලෑස්ති වුණා.

"දුවේ මටයි තාත්තටයි අද ගමනක්

යන්න වෙනවා එනකොට ටිකක්

පරක්කු වෙයි. ඔයාලා දෙන්නා

ගෙදරට ඇවිල්ලා හොදට දොරවල්

වහගෙන ඉන්න" අම්මා කිව්වා.

මලී අක්කා එක්ක ඉස්කෝලෙ ගිහින් ගෙදර ආවා. ඊටපස්සේ මේ දෙන්නා ඉස්කෝලෙ වැඩ කර කර ඉද්දි දන්නෙම නැතුව හවස් වෙලා ටික වෙලාවකින් වැස්සකුත් ඇදහැලුනා.

වැස්ස හොඳටම සැරවෙලා මලීලා

කාමරේට වෙලා පොතක් කියව කියව

ඉන්නකො කුස්සිය පැත්තෙන් කුකු

බුරන සද්දයක් ඇහුණා.

මලියි අක්කයි ඉක්මනට ඒ පැත්තට

දුවගෙන ගියා.

ගහක අත්තක් ගේ උඩට කඩන්

වැටෙන්න ඔන්න මෙන්න තියනවා

අක්කා දැක්කා. අක්කා ඉක්මන්ට

කුකූවයි මලීවයි එක්කගෙන පහළ

අක්කලාගෙ ගෙදරට දිව්වා. "චූටි කුකූ

හිටියෙ නැත්තන් අපි දෙන්නම

ඉවරයි" මලී කිව්වා. හැමෝම චූටි

කුකූගෙ ඔළුව අතගාලා ප්‍රශංසා කළා.

# නිමි.

# <u>පසුවදන</u>



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානිතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයකු වීමට ශක්තිය ලැබේවායි පතමු ...

මෙයට,
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023.11.01

9 786242 067049